## වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව

**<u>2025 වර්ෂයේ/ 06 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්ථාව</u>**

**<u>2025.10.14</u>**

<u>සහභාගි වූ මන්ත්‍රීවරුන්</u>

1. ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා
2. ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා
3. ගරු මන්ත්‍රි ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා
4. ගරු මන්ත්‍රි එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා
5. ගරු මන්ත්‍රි කේ.වී.සුසන්ත පෙරේරා මයා
6. ගරු මන්ත්‍රි බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා
7. ගරු මන්ත්‍රි ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා
8. ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය
9. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය
10. ගරු මන්ත්‍රි ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා
11. ගරු මන්ත්‍රි කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා
12. ගරු මන්ත්‍රි කේ.බී.වරුණ පෙරේරා මයා
13. ගරු මන්ත්‍රි ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා
14. ගරු මන්ත්‍රි ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා
15. ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය
16. ගරු මන්ත්‍රි සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා
17. ගරු මන්ත්‍රි අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා
18. ගරු මන්ත්‍රි ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා
19. ගරු මන්ත්‍රි ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා
20. ගරු මන්ත්‍රි කේ.එල්.සමන් රෝහිත මයා
21. ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය
22. ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය
23. ගරු මන්ත්‍රි එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා
24. ගරු මන්ත්‍රි ජගත් කීර්ති කුමාර අබේරත්න මයා
25. ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය
26. ගරු මන්ත්‍රි ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා
27. ගරු මන්ත්‍රි කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා
28. ගරු මන්ත්‍රි ඒ.ඒ.චොහාන් සන්දීප් මයා
29. ගරු මන්ත්‍රි කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා
30. ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය

31. ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා
32. ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා
33. ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා
34. ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා
35. ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා
36. ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා
37. ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය
38. ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රත්තිලක මිය
39. ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා
40. ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා
41. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා
42. ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා

සහභාගි නොවූ මන්ත්‍රීවරුන්

1. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා
2. ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය

මෙදින පෙ.ව 9.00ට මහ සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති ටී.බී.ඩී. ඇන්ටනී කුමාර් මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශිය සභා මහ සභා රැස්වීම් ශාලාවේදි ආරම්භ විය.

**1. 2025.09.09 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

2025.09.09 දිනැති මහ සභා වාර්තාව සත්‍යයක් බව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් යෝජනා කල අතර එම යෝජනාව පහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

**2025.09.09 දින පැවති මහ සභා රැස්වීම් වාර්ථාවේ සංශෝධන :-**

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා විසින් 2025.09.09 දින පැවති මහ සභාවේදි නීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන ලදි. එනම් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසු යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සභිකවරු සියලු දෙනා අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කල යුතු බවයි. එමෙන්ම මෙතෙක් සම්මත වූ යෝජනාවන් රීති වලට අනුකූලව සිදු නොවූ බව අභියෝගයට ලක් කරන බව පවසන ලදි. ඒ අනුව 2025.09.09 මහ සභා වාර්තාවේ ඉහත කරුණු සඳහන් නොවී ඇති අතර එය සංශෝධනය විය යුතු බව පවසන ලදි. එමෙන්ම "විපක්ෂයේ මන්ත්‍රීවරු" ලෙස සඳහන් නොකර සියලු දෙනාම "මන්ත්‍රීවරු" ලෙස හැදින්වීම සුදුසු බව පවසන ලදි.

<u>යෝජනා අංක 2</u>

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා විසින් වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාවෙන් පිටත කසල ඉවත් කිරීමේ සේවාව සපයන නිවාස සඳහා මසකට රු.200.00 බැගින් අය කිරීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් ඉල්ලා සිටි නමුත් 2025.09.09 දින මහ සභා වාර්තාවේ එම කරුණෙහි අර්ථය වෙනස් වී ඇති අතර ගරු සභාපතිතුමාගේ අදහස් ඉදිරිපත් කිරීමට අනුව කසල එකතු කරන කම්කරුවන් සඳහා දිමනා ලබා දීම මෙම වරිපනම් මුදල එකතු කිරීමේ එක් අරමුණක් බව පැවසුද වාර්තාවේ සඳහන් වී ඇති ආකාරයට ගම්‍ය වන්නේ ගරු සභාපතිතුමා සිදු කරමින් යන වැඩපිලිවෙලට විරුද්ධව ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා ඡන්ද විමසීමක් ඉල්ලූ බවයි. ඒ අනුව ඡන්ද විමසීමක් සිදු කලේ වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාවෙන් පිටත කසල ඉවත් කිරීමේ සේවාව සපයන නිවාස සඳහා මසකට රු.200.00 බැගින් අය කිරීමට ඉදිරිපත් කල යෝජනාවට බව ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්රීනාත් ප්‍රනාන්දු මයා විසින් පවසන ලදි.

**2. ගරු සභාපති තුමාගේ විශේෂ නිවේදන**

I. මන්ත්‍රීමණ්ඩලයේ යෝජනා හැකි සෑම විටම අදාල කාරක සභාවට යොමු කිරීමෙන් පසුව, ඒ සඳහා තවදුරටත් මහ සභාවේ අනුමැතිය අවශ්‍ය වේ නම් කාරක සභාව මඟින් මහසභාවට ඉදිරිපත් කල යුතුය.

II. පළාත් පාලන කාර්ය සාධන තරඟයේ ජාතික තරඟය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයෙන් වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව තේරී ඇත. ජාතික තරග විනිශ්චය සඳහා ඔක්තෝබර් මස 15 දින පැමිණෙන බව දැනුම් දී ඇත.

III. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ සිවු අවුරුදු සැලැස්ම සකස් කිරීම සඳහා මන්ත්‍රීවරුන්ගේ යෝජනා සකස් කර තබා ගන්නා ලෙස කාරුණිකව දන්වමි. ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කඩිනමින් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

IV. පළාත් පාලන අමාත්‍යාංශයේ උපදෙස් මත පවත්වන ලද පළාත් පාලන සතිය වැඩසටහන සැප්තැම්බර් මස 15 දින සිට 21 දින දක්වා සාර්ථකව පවත්වන ලදි. ඒ සඳහා සහයෝගය ලබා දුන් ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීමණ්ඩලය වෙතත් කාර්ය මණ්ඩලයේ සියලු දෙනා වෙතත් ස්තූතිය පුද කර සිටිමි.

V. 2026 අයවැය කෙටුම්පත් සභා සම්මත කිරීම 2025.11.11 දින සභාවට ඉදිරිපත් කිරීමට සූදානමින් පවති.

ඉන්පසු ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා විසින් රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන ලදි. එනම් සභාව සිදු කරමින් යන පිළිවෙල අනුව සභාව වෙත සංදේශ, පෙත්සම් හා පැමිණිලි සභාව ඉදිරියේ තැබිය හැකිය යන්නයි. ඒ අනුව එම මොහොතේ ලැබී තිබූ ලිපි කියවීමට ආරම්භ කලද ගරු සභාපතිතුමා පවසා සිටියේ එම මොහොතේ පැමිණිලි ඉදිරිපත් කල නොහැකි අතර මහ සභා රැස්වීමට පෙර ලේකම්තුමාට එම පැමිණිලි ලබා දිය යුතු බවයි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා පවසා සිටියේ යම් කිසි සභිකයෙකු විසින් තම ලිපිනය සහිතව ලියා අත්සන් කර ඇති කවර තැනැත්තේකු විසින් තමා වෙත ඉදිරිපත් කර ඇති සංදේශයක් සභාවේ අවධානයට ලක් කරමින් එම සංදේශ සභාපතිවරා වෙත හෝ වෙනත් කාරක සභාවක් වෙත යොමු කර ගැනීම සඳහා  මෙම අවස්ථාව උපයෝගි කර ගත හැකි බව රීති පොතේ සඳහන්ව ඇති බව පවසන ලදි. ඒ අනුව ගරු සභාපතිතුමාගේ නිවේදන වලින් පසුව පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කල හැකි බව පවසන ලදි.

ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ සියලුම පැමිණිලි හා පෙත්සම් යනාදිය සභා වාරය ආරම්භ කිරීමට පෙර ලේකම්තුමාට භාර දිය යුතු අතර ලේකම්තුමාගේ නිර්දේශය සහිතව ගරු සභාපතිතුමාට ලබා දිය යුතු බවයි. ඒ අනුව එම මොහොතේ සභා වාරය ආරම්භ කිරීමට පෙර එම අදාල පැමිණිලි ලබා නොදුන් බැවින් ඒවා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා නොදෙන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා පවසා සිටියේ ගරු සභාපතිතුමා පවසන ආකාරයේ කරුණක් එනම් සභා වාරය ආරම්භ කිරීමට ප්‍රථම පෙත්සම් හා පැමිණිලි ලබා දිය යුතුය යනුවෙන් රීති අංක 9 හි සඳහන් නොවන බවයි. ඒ අනුව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතාට ඊළඟ සභා වාරයේදි හෝ අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා කතා කරමින්, විපක්ෂ නායකයින් 04 දෙනෙකු යටතේ කටයුතු කල අතර එකල ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ පාලන සමයේදිද විවිධ පීඩන හා අභියෝගයන්ට මුහුණ දුන් නමුත් එකල සභාපතිතුමන්ට තිබූ පීඩනය වර්තමාන ගරු සභාපතිතුමන්ට විපක්ෂයේ මන්ත්‍රීවරුන් ලබා නොදෙන අතර වර්තමාන මන්ත්‍රී මණ්ඩලයේ 44 දෙනාගෙන් 34 දෙනෙකුම නව මන්ත්‍රීවරුන් වන බැවින් අත්දැකීමක් නොමැති බව පවසන ලදි. එකල වෙනත් කරුණු යටතේ විවිධ ගැටලු සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුනද වර්තමාන මහ සභාව තුල එම අවස්ථාව ගිලිහි ඇති බවත් ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු ලෙස පත් වී මහ සභාවට පැමිණෙන්නේ ජනතාවගේ පොදු ප්‍රශ්න ගැටලු විසඳීමට මිස මහ සභා රැස්වීම් ශාලාවේ විදුලිය අවම කිරීමට හා විදුලිපංකා නාස්තිය අවම කිරීමට නොවන බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, සියලුම රීති පිළිබඳව එතුමා දැනුවත් බවත් සභා වාරය ආරම්භ කිරීමට ප්‍රථම ලේකම්තුමාට ඒවා භාර දිය යුතු අතර ලේකම්තුමාගේ නිර්දේශය ඇතිව ගරු සභාපතිතුමාට භාර දිය යුතු බව පවසන ලදි. කිසිදු අයෙකුට පෙත්සම් හා පැමිණිලි යනාදිය ඍජුවම මූලසුනට ඉදිරිපත් කල නොහැකි අතර ඒ පිළිබඳ වාද විවාද කිරීමට අවස්ථාවක් නොමැති බව පවසන ලදි. ඒ අනුව රීති වලින්

පිට කිසිදු ආකාරයෙන් ක්‍රියා නොකරන බවද පවසන ලදි. ගරු සභාපතිතුමා මන්ත්‍රීතුමෙකු වී සිටි කාලයේදී ඉහත අවස්ථාව වාර ගණනකදී ලබා ගෙන ඇති නමුත් කිසිදු අවස්ථාවක රීති රාමුවෙන් පිට කටයුතු නොකල බව පවසන ලදි. එමෙන්ම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම පිළිබඳව කණගාටු වන බවත් පවසන ලදි. මහ සභා රීති ගරු සභාපතිතුමාගේ නිර්මාණයක් නොවන අතර එය රටේ නීතියක්වන බවද පවසන ලදි.

## 3. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න :-

i. 2022 මහා මාර්ග අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කල වැඩසටහන් මඟින් මාර්ග කොපමණ සංඛ්‍යාවක් කොන්ක්‍රීට් කර තිබේද?

- පිළිතුර: මාර්ග 146

ii. එයින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා නිම කිරීමෙන් පසුව සභාවේ කොපමණ මුදලක් ඉතිරි වී තිබේද?

- පිළිතුර: රු. 391,000.00

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා ඉහත මුදල ප්‍රධාන ගිණුමට බැර නොකර නිලධාරින්ගේ සුභසාධනය වෙනුවෙන් ලබා දෙන ලෙස යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය විසින් ස්ථිර කරන ලදි.

## 4. යථා පරිදි කල් දී ඇති යෝජනා

1) දංකොටුව නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවෙහි සුවතා ඒකකයෙහි ප්‍රතිකාර සඳහා මිළගණන් තීරණය කිරීමට අදාල යෝජනාව ඉහත යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| | | |
|---|---|---|
| 1. | නස්‍ය කර්ම | - රු.1000.00 |
| 2. | තෛල වාෂ්ප | - රු.1000.00 |
| 3. | වාෂ්ප ස්වේද | - රු.5000.00 |
| 4. | කටී වස්ති | - රු.3000.00 |
| 5. | තෛල පිචු | - රු.800.00 |
| 6. | උද්වර්තන | - රු.3000.00 |
| 7. | ශරීර විමර්ධනය | - රු.3000.00 |
| 8. | පූර්ණ ශිර්ෂ අභ්‍යාංගය | - රු.2000.00 |
| 9. | අර්ධ ශිර්ෂ අභ්‍යාංගය | - රු.1000.00 |
| 10. | පූර්ණ පෘෂ්ඨ අභ්‍යාංගය | - රු.1500.00 |
| 11. | අර්ධ පෘෂ්ඨ අභ්‍යාංගය | - රු.1000.00 |
| 12. | ගෙල හා උරහිස අභ්‍යාංගය | - රු.1000.00 |
| 13. | පූර්ණ පාද අභ්‍යාංගය | - රු.1500.00 |
| 14. | අර්ධ පාද අභ්‍යාංගය | - රු. 750.00 |

15. වක්‍ර අභ්‍යංගය - රු.1000.00
16. ආයුර්වේද මුහුණු සත්කාරය - රු.1500-2500

2) හලාවත තරුණ ජාතික තරුණ සේවා සභාවේ 2025 දෙවන අධ්‍යනවාරයේ තොරතුරු හා සන්නිවේදන ශිල්පි පාඨමාලාව හදාරන A.H.M.සියඹලාපිටිය(ජා.හැ.අං 200579403985) මෙනවියට ප්‍රාදේශිය සභාවෙන් මාස 06ක ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

3) සේවා ගිවිසුම් පදනම මත සේවයේ යෙදී සිටින සේවකයින්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අ.අං | නම | තනතුර | කාල සීමාව |
|---|---|---|---|
| 1 | එම්.එන්.මිලානි කරුණාතිලක (සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගනය) | සෞඛ්‍ය කම්කරු | 2025.11.19-2026.05.18 |
| 2 | ඒ.පී.ශවින් දුල්ෂාන් (කිරිමැටියාන පුස්තකාලය) | සෞඛ්‍ය කම්කරු | 2025.11.22-2026.05.21 |

4) දංකොටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මැල්ලව කහටවිල වත්ත පේෂකර්ම මධ්‍යස්ථානය පිහිටි රජයේ ඉඩමෙන් පර්.32.1ක් වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට එකඟතාවය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කල අතර එය පෙන්වා දෙන්නේ මහ සභා කටයුතු නිසි අයුරින් පවත්වා ගෙන යාමට මිස ගරු සභාපතිතුමාට ගැටලුවක් ඇති කිරීමට නොවන බව පවසන ලදි. ඒ අනුව මහ සභා රීතියට අනුව වාර්තාවට ඇතුලත් විය යුතු නීතිමය අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි කරුණු ඇතුලත් කරමින් නීතිමය වශයෙන් ඇතුලත් නොවන සෙසු කරුණු (යෝජනා සම්බන්ධයෙන් දක්වන අදහස්) සම්බන්ධ මහ සභාවේ එකඟතාවය ඇතිව එය වාර්තාවට ඇතුලත් නොකිරීමට ක්‍රියාත්මක වන්නේ නම් ඒ මත සංක්ෂිප්ත වාර්තාවක් සකස් කිරීමට හැකියාව ඇත යනුවෙන් රීති පොතෙහි සඳහන් වී ඇති බව පවසන ලදි.ඒ අනුව මහ සභා වාර්තා සංක්ෂිප්ත කිරීමට පෙර මහ සභාවේ එකඟතාවය ලබා ගැනීම සුදුසු බව පවසන ලදි. එසේ නොමැති විට යම් යම් සංශෝධන පිළිබඳ තර්ක කිරීමට සිදු වන අතර එය නිවැරදි කර ගැනීම සුදුසු බව පවසන ලදි. එසේම මෙතෙක් පැවති ක්‍රමවේදයට අනුව සංක්ෂිප්ත වාර්තාවක් ලබා නොදි ඇත්තේ මන්ත්‍රිමණ්ඩලය ඒ සම්බන්ධයෙන් එකඟතාවය ලබා නොදුන් නිසා බව පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ මීළඟ සභා වාරයේදි මේ පිළිබඳ සලකා බලන බවයි. නමුත් මේ වන විට පළාත් පාලන දෙපාර්තමේනතුවෙන් ලැබී ඇති උපදෙස් අනුව මහ සභාවේ කරුණු කෙටියෙන් අන්තර්ගත කල යුතු අතර මන්ත්‍රිමණ්ඩලය වාද විවාද කරමින් ගනු ලබන තීරණ පමණක් සඳහන් විය

යුතු බව පවසන ලදි. කරුණු පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීමට කාරක සභා වෙත බලය පවරා ඇති බැවින් මහ සභාව තුල සිදු කල යුත්තේ තීන්දු තීරණ ගැනීම පමණක් බව පවසන ලදි.

5) වෙන්නප්පුව මහජන පුස්තකාලයේ ස්ථාපිත කොහා මෘදුකාංගය සඳහා දත්ත ඇතුලත් කිරීමට කොන්ත්‍රාත් පදනම මත දත්ත ඇතුලත් කිරීමේ නිලධාරියෙකු බඳවා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විමසා සිටියේ දැනට සිටින නිලධාරීන්ට මෙම මෘදුකාංගය පිළිබඳ අවබෝධයක් නැතිද යන්නයි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ දැනට එක් නිලධාරියෙකු සිටින අතර මේ වන විට පවතින කාර්යබහුලත්වය සහ හැකියා වේගය ගත් කල ලොකු කාලයක් මේ සඳහා වැය කිරීමට සිදු වන බැවින් වෙනත් නිලධාරියෙකු බඳවා ගන්නේ නම් සීමිත කාලයක් තුල විශාල වැඩ ප්‍රමාණයක් කිරීමට හැකියාව පවතින බවයි.

6) ප්‍රදේශයේ ජල ගැටලු පවතින ප්‍රදේශවල අවමංගල්‍ය උත්සව සඳහා සහ වෙනත් පොදු උත්සව සඳහා ජල බවුසර් ලබා දීමේදි අයකල යුතු ගාස්තුව පිළිබඳ තීරණයක් ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා විසින් ස්ථිර කිරන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා කතා කරමින්, මෙම ගැටලුව සම්න්ධයෙන් මහ සභාවට ලිපියක්ද ඉදිරිපත් කල අතර පසුගිය වකවානුවේ තිබූ ක්‍රමයට අනුව අවමංගල්‍ය,පන්සල්, පල්ලි හා දන්සල් සඳහා ජලය ලබා දීමේදි ජලයට අය කරන ගාස්තුව පමණක් අය කර ප්‍රවාහන ගාස්තුව අය නොකර ජලය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය කතා කරමින්, ජලය යනු මූලික මිනිස් අවශ්‍යතාවයක් වන අතර ජල පහසුකම් සැපයීම පළාත් පාලන ආයතනයක් මඟින් ඉටු කරන සේවාවක් බව පවසන ලදි. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සමස්ත ජනතාවම නොවුනත් ඇතැම් පිරිස් හට අවමංගල්‍ය අවස්ථාවල හා පොදු උත්සව අවස්ථාවල ජලය නැමැති මූලික අවශ්‍යතාවය බලාපොරොත්තු වන බව පවසන ලදි. ඒ අනුව ප්‍රාදේශීය සභාවෙන් ජනතාව බලාපොරොත්තු වන ප්‍රයෝජනවත් සේවාවන් රැසක් අතරින් එකක් වනුයේ ජලය ලබා දීම බව පැවසූ අතර ජලය හිඟ තැන්වලට සහ පානීය ජල ගැටලුව පවතින ස්ථානවලට අවමංගල්‍ය කටයුතු වලදි හා පොදු උත්සව අවස්ථාවලදි පානයට ගන්නා ජලයට මිලක් තීරණය නොකර නොමිලේ ජල බවුසර් ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ මීට වසර කිහිපයකට පෙර නියං කාලයක් පැවති සමයේදි ගම්වල සියලු දෙනාටම ජලය නොමැතිව තිබූ කාලයකදි ප්‍රාදේශීය සභාව විසින් ජලය ලබා දී ඇති අතර එම ජල ටැංකි පිළිබඳ සොයා බැලිය යුතු අතර එවැනි අවස්ථාවල ජනතාවට ජලය නොමිලේ ලබා දිය යුතු අතර ඒ පිළිපදව සලකා බලා තීරණයක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මහතා කතා කරමින්, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවියට ස්තූති කල අතර පානීය ජල අවශ්‍යතාවය වැඩි වශයෙන් බලපාන්නේ තුලාවල සහ

කිරිමැටියාන යන කොට්ඨාසවලට වන අතර ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය විසින් ඉදිරිපත් කල යෝජනාවට එකඟ වන බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ඉහත යෝජනා සියල්ලම පිලිගන්නා අතර අවමංගල්‍ය අවස්ථාවල පමණක් නොව පොදු උත්සව අවස්ථාවලදි ද ජලයලබා දීමේදි ප්‍රායෝගික ගැටලුවක් පවතින අතර එම ගැටලුවට හොඳම විසඳුම ලෙස පොදු උත්සව අවස්ථාවලදි ටැංකි වලට ජලය පුරවා දීමෙන් සියලු දෙනාටම ජලය ලබා දිය හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රි එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ දුම්මලදෙනිය ප්‍රදේශයේ කසල අංගනය අසල නිතරම ජල බවුසරයක් නවතා ඇති අතර එයද සභාවේ ප්‍රයෝජනයට ගන්නේ නම් වැඩි වැඩ ප්‍රමාණයක් කර ගත හැකි බවයි.

ඒ අනුව අවමංගල්‍ය අවස්ථාවලදි ජල බවුසරය නොමිලේ ලබා දෙන අතර අනෙකුත් පොදු උත්සව අවස්ථා සඳහා ජලය ටැංකි වලට පුරවා ලබා දෙන බවට තීරණය කරන ලදි. ඒ අනුව මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

7) සභවේ අභ්‍යන්තර විගණන කමිටුව සංශෝධනයට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

i. එම්.ඒ.උත්පලා සඳරුවනි මිය - සංවර්ධන නිළධාරි (අභ්‍යන්තර විගණන නිලධාරි)
ii. එච්.පී.සමන්ත කුමාර මයා - කළමනාකරණ සේවා නිලධාරි (ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
iii. එච්.ඒ.ඩී.හෙට්ටිආරච්චි මිය - කළමනාකරණ සේවා නිලධාරි (කිරිමැටියාන කාර්යභාර්ය නිලධාරි

8) දංකොටුව උප කාර්යාලයට අයත් කඩකාමර 21ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අනු අංකය | කඩ කාමර අංකය | නම | මාසික කුලිය |
|---|---|---|---|
| 01 | එළවලු කඩ 01(පලතුරු) | ජී.අයිරින් ප්‍රනාන්දු | 1300 |
| 02 | එළවලු කඩ 02 | එම්.පියවර්ධන | 1300 |
| 03 | එළවලු කඩ 03 | එම්.මාකස් | 1300 |
| 04 | එළවලු කඩ 04 | එම්.ගුණවර්ධන | 1300 |
| 05 | එළවලු කඩ 05 | එස්.එම්.ජයලාල් | 1300 |
| 06 | එළවලු කඩ 06 (එළවලු හා පලතුරු) | ජේ.ඒ.ඩී.වයලට් | 1300 |
| 07 | එළවලු කඩ 07 | වින්සන් අප්පුහාමි | 1300 |
| 08 | එළවලු කඩ 08 | එඩ්වඩ් පෙරේරා | 1300 |
| 09 | එළවලු කඩ 09(කරවල) | ඩබ්.ඒ.ඩී.ජී.එස්.අප්පුහාමි | 1300 |
| 10 | එළවලු කඩ 10 | ඩී.ඒ.නාලක ප්‍රදීප් | 1300 |

| | | | |
|---|---|---|---|
| 11 | මාළු වෙළෙඳසැල 01 | ඩබ්.පී.වින්සන් වනසිංහ | 15000 |
| 12 | මාළු වෙළෙඳසැල 02 | ඩබ්.පී.වර්ණ ප්‍රභාෂ් විජේරත්න | 15000 |
| 13 | මාළු වෙළෙඳසැල 03 | ඩබ්.පී.සුනිල් වනසිංහ | 15000 |
| 14 | මාළු වෙළෙඳසැල 04 | ඩබ්.පී.ප්‍රේමදාස | 15000 |
| 15 | මාළු වෙළෙඳසැල 05 | ඩබ්.පී.නුවන් සංජීව | 9000 |
| 16 | මාළු වෙළෙඳසැල 07 | යූ.නිහාල් රාජකරුණා | 9000 |
| 17 | දංකොටුව තාවකාලික කඩ 02 | පී.ඒ.සුසිලා බර්නදෙත් | 1000 |
| 18 | දංකොටුව තාවකාලික කඩ 03 | ජේ.ඒ.ඩී.නෙවිල් අප්පුහාමි | 1500 |
| 19 | දංකොටුව තාවකාලික කඩ 04 | ඩබ්.ඒ.ආර්.සම්පත් | 2000 |
| 20 | දංකොටුව තාවකාලික කඩ 05(ලොරයි) | ජේ.ඒ.නුවන් මංජුල | 800 |
| 21 | යෝගියාන පොදු වෙළෙඳපොල බිම් මහල 01 | ජී.ඒ.එම්.කරුණාවතී මැණිකේ | 3300 |

9) කම්මල්පත්තුව උප කාර්යාලයට අයත් කඩකාමර 14ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අනු අංකය | පිහිටි ස්ථානය | කඩ කාමර අංකය | බදුකරුගේ නම | මාසික කුලිය රු. |
|---|---|---|---|---|
| 01 | හණතොටුපල වෙළඳ සංකීර්ණය | කඩ කාමර අංක 03 | ඩබ්.චිත්‍රා සදමාලි | 2200.00 |
| | | කඩ කාමර අංක 04 | එම්.එම්.ලසදා දයානි | 2200.00 |
| | | කඩ කාමර අංක 05 | ඩබ්.ඒ්.ඩී.රෝෂිණි ප්‍රනාන්දු | 2200.00 |
| 02 | හණතොටුපල වෙළඳ සංකීර්ණය උඩු මහල | කඩ කාමර අංක 01 | ඩබ්.අයි.පිලමින් රාණි | 2000.00 |
| | | කඩ කාමර අංක 02 | ඩබ්.අයි.පිලමින් රාණි | 2500.00 |
| | | කඩ කාමර අංක 03 | ඩබ්.සිරිපිලමිනා ප්‍රනාන්දු | 2500.00 |
| | | කඩ කාමර අංක 04 | ජී.දිස්නා රංජනි පෙරේරා | 2500.00 |
| | | කඩ කාමර අංක 05 | ජේ.චන්දිමා ප්‍රනාන්දු | 1600.00 |
| | | කඩ කාමර අංක 06 | ඒ්.ඒ්.ශිරෝමි ප්‍රියංගිකා ප්‍රනාන්දු | 1600.00 |
| 03 | වයික්කාල වෙළඳ සංකීර්ණය | කඩ කාමර අංක 01 | ඉරේෂා ලක්මාලි සිල්වා | 3800.00 |
| | | කඩ කාමර අංක 03 | H.A.ගාමිණි ප්‍රියන්ත (දිලීප ප්‍රියංකර පෙරේරා | 3800.00 |
| 04 | බෝලවත්ත වෙළඳ සංකීර්ණය | කඩ කාමර අංක 01 | ඩබ්.ගාමිණී ප්‍රනාන්දු | 7150.00 |
| | | කඩ කාමර අංක 02 | ඩබ්.නිව්ටන් ප්‍රනාන්දු | 6900.00 |
| | | කඩ කාමර අංක 03 | ඩබ්.නිව්ටන් ප්‍රනාන්දු | 6500.00 |
| 05 | පොලිස් අධිකාරි කාර්යාලය වෙන්නප්පුව | | පොලිස් අධිකාරී, සහකාර පොලිස් අධිකාරී කාර්යාලය, දුම්මලදෙනිය. | 7500.00 |

10) බණ්ඩිරිප්පුව ශු.ජපමාල මාතා දහම් පාසලේ අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා සභා අරමුදලින් රු.25000.00ක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම

යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

11) ආසියානු ප්‍රවීණයන්ගේ මළල ක්‍රීඩා තරගාවලිය සඳහා සහභාගී වන ඉවෝන් රූපානි මිය වෙත රු.15000.00ක ආධාර මුදලක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

12) දංකොටුව නව වෙළඳ සංකීර්ණයේ බිම්මහල පිටුපස අංක 11 කඩකාමරයේ බදු කාලය වසර 03කින් දීර්ඝ කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, මීට වසර 03ට පෙරදීත් රු.1000ක බදු මුදලට ලබා දී ඇති අතර 2025 වන විටත් එම වටිනකම වැඩි වී නොමැත්තේ ව්‍යාපාරය දියුණු වී නොමැති නිසාද යන්න විමසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ තක්සේරු මුදල වසර 03කට වරක් වෙනස් වන බැවින් මේ සම්බන්ධයෙන් තවම තක්සේරු වටිනාකමක් ලැබී නොමැති බවයි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා පවසා සිටියේ බදු කාලය වසර 03කට නොව වසරකට ලබා දීම සුදුසු බවයි.

ඒ අනුව එහි ප්‍රායෝගිත තත්වය සොයා බලා තීරණයක් ගැනීම සුදුසු බව ගරු සනභාපතිතුමා විසින් පවසන ලදි.

ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා කතා කරමින්, තම කොට්ඨාසය තුල ජනතාව සමඟ මෙම ගැටලුව පිළිබඳ සාකච්ඡා කල අතර නව තක්සෙරුව සමඟ මුදල තීරණය කල හැකි නමුත් බදු කාලය වසරකට ලබා දීමෙන් කඩ හිමියාට යම් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට අසීරු තත්වයක් පවතින බව පවසන ලදි. එම නිසා තක්සේරුවට අනුකූලව මීළඟට ගිවිසුම්ගත වන ගිවිසුම් කාලය කොපමණදැයි තීරණය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව මේ පිළිබඳ ආදායම් අංශ ප්‍රධානි මධුකා මියගෙන් අදහස් විමසීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ආදායම් අංශ ප්‍රධානි මහත්මිය විසින් ඉහත කරුණ සම්බන්ධයෙන් පැහැදිලි කරන ලදි. ඉන්පසු නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මහතා විසින් ස්ථිර කරන ලදි.

13) වෙන්නප්පුව පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 10 ඩබ්.නන්දනි දමයන්ති පෙරේරා මහත්මියට අයත් කඩකාමරය ලසන්ත ප්‍රේමකුමාර විමලදාස යන අය වෙත පැවරීම් ගාස්තුවට යටත්ව වසර 03ක කාලයට බදු දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු

මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

14) වෙන්නප්පුව පැරණි වෙළඳ සංකීර්ණයේ එම්.එම්.සී.වාස් මහතාට බදු දී ඇති අංක 09 කඩ කාමරය බදුකාලය වසර 03කින් දීර්ඝ කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

15) පුස්තකාල වැඩසටහන් සඳහා අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අ. අං | පුස්තකාලය | වැඩසටහන | මුදල (රු) |
|---|---|---|---|
| 1 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | සිංහල ජන සංස්කෘතිය තුල සිංහල සාහිත්‍යයේ නැඟීම සම්බන්ධව ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 8500.00 |
| 2 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | අ.පො.ස සා/පෙ සිසුන් සඳහා සිංහල/ගණිතය/ඉංග්‍රීසි සම්මන්ත්‍රණයක් පැවැත්වීම. | 15000.00 |
| 3 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | ලෝක වැඩිහිටි දිනය වෙනුවෙන් සෞඛ්‍ය දේශනයක් සමඟ සායනයක් පැවැත්වීම | 10000.00 |
| 4 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | ලෝක ළමා දිනය හා කියවීම් මාසයට අදාලව ගීත රසවින්දනය හා කියවීම් කඳවුරක් පැවැත්වීම. | 17500.00 |
| 5 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | නව තාක්ෂණය තුළින් ළමා ලෝකයට ලැබෙන්නාවූ වාසි/අවාසි පිළිබඳ ළමුන් සහ දෙමාපියන් දැනුවත් කර එයින් ඔවුන්ට ලැබෙන මානසික, ශාරීරික බලපෑම් පිළිබඳ කියා දීම. | 10000.00 |
| 6 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | ළමා හිංසනය හා ලිංගික අපයෝජනය තුලින් ඇතිවන්නාවූ මානසික පීඩනයෙන් ළමුන් ගලවා ගැනීමේ උපදේශන වැඩසටහන | 8000.00 |
| 7 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | ලෝක ළමා දිනය සමරමින් කතන්දර පැය සංවත්සරික වැඩසටහන | 20000.00 |
| 8 | මහයායවත්ත මහජන පුස්තකාලය | සාහිත්‍ය මාසයට සමගාමී ප්‍රහේලිකා තරගය | 8500.00 |
| 9 | මහයායවත්ත මහජන පුස්තකාලය | මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 3000.00 |
| 10 | මහයායවත්ත මහජන පුස්තකාලය | කාන්තාවන්ට ස්වයං රැකියා අත්වැලක් ලෙස කේක් සෑදීම වැඩමුළුව. | 7000.00 |
| 11 | බුජ්ජම්පොළ මහජන පුස්තකාලය | කතන්දරයක් අහමු තෑගි දිනමු වැඩසටහන | 10000.00 |
| 12 | බුජ්ජම්පොළ මහජන පුස්තකාලය | පාඨක ඔබ අපේ වත්කමයි ජංගම පාඨක ප්‍රවර්ධන | 8000.00 |

| | | | |
|---|---|---|---|
| 13 | බුජ්ජම්පොළ මහජන පුස්තකාලය | සාර්ථකත්වයට මඟ පෙන්වමින් පුද්ගල හැකියා පෞරුෂත්වය වර්ධනය මනෝවිද්‍යා වැඩසටහන | 18000.00 |
| 14 | බුජ්ජම්පොළ මහජන පුස්තකාලය | විද්‍යා දැනුමට හා මානසික සුවය පිණිස තරු කඳවුරක් පැවැත්වීම. | 23000.00 |
| 15 | බුජ්ජම්පොළ මහජන පුස්තකාලය | ශ්‍රමදානය සහ වර්ෂ අවසාන පිංකම | 2000.00 |
| 16 | කහටවිල මහජන පුස්තකාලය | මත්ද්‍රව්‍ය පිටුදැකීමට අදාල අත් පත්‍රිකා බෙදා දීමේ වැඩසටහන | 6000.00 |
| 17 | කහටවිල මහජන පුස්තකාලය | සිංහල සාහිත්‍ය රසවින්දනාත්මක දේශනය | 12000.00 |
| 18 | කහටවිල මහජන පුස්තකාලය | දරුවන්ගේ දක්ෂතා ඇගයීමේ වැඩසටහන | 10000.00 |
| 19 | කහටවිල මහජන පුස්තකාලය | නත්තල් කැරොල් ගීතිකා වැඩසටහන | 12500.00 |
| 20 | කිරිමැටියාන මහජන පුස්තකාලය | හොඳම ගෘහස්ථ පුස්තකාලය තෝරා පත් කර ගැනීම | 12000.00 |
| 21 | කිරිමැටියාන මහජන පුස්තකාලය | ළමා දින දරුවන් ඇගයීමේ විශේෂ වැඩසටහන | 23000.00 |
| 22 | කිරිමැටියාන මහජන පුස්තකාලය | විවාද තරඟය | 2000.00 |
| 23 | කිරිමැටියාන මහජන පුස්තකාලය | සක්‍රිය පාඨකයින් ඇගයීම | 8000.00 |
| 24 | කිරිමැටියාන මහජන පුස්තකාලය | සමාජ මාධ්‍ය නිවැරදිව භාවිතා කිරීම | 5000.00 |
| 25 | කිරිමැටියාන මහජන පුස්තකාලය | ටැබ් භාවිතයෙන් ඉගෙනීම | 25000.00 |
| 26 | කිරිමැටියාන මහජන පුස්තකාලය | පුස්තකාල පාඨක ප්‍රදර්ශනය හා නිමැවුම් අලෙවිය | 15000.00 |

මේ පිළිබඳ පැහැදිලි කිරීමට ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සභාපති ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතාට අවස්ථාව ලබා දෙන ලදි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතා කතා කරමින්, පුස්තකලයන්හි කාලයක් පටන් පැවත ආ වැඩසටහන් එලෙසම ඇතුලත් කල අතර මෙහි ප්‍රධාන වශයෙන් පාඨක සමාජය ඉලක්ක කර ගෙන කටයුතු කිරීම ප්‍රධාන අරමුණ බව පවසන ලදි. ඊට අමතරව පුස්තකාල වැඩසටහන් සම්බන්ධ කර ඇත්තේ සංවර්ධන කමිටුවේ වැය ශීර්ෂ වලට යටත්ව බව පවසන ලදි. ඒ අනුව කර්යසාධනය සාර්ථක කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කර ගැනීමට මෙම පාඨක සමාජය ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන් දියත් කිරීමට කටයුතු කරන බව පවසන ලදි. එමෙන්ම පාඨක සමාජයේ වර්ධනයට පමණක් නොව ගුණාත්මක සමාජයක් ඇති කිරීම අරමුණු කරගෙනද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර පුස්තකාල උපදේශන කමිටුව මඟින් සාකච්ඡා කර ඉදිරියේදි නව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව පවසන ලදි. එමෙන්ම පුස්තකාල හරහා සිදු කිරීමට තවත් අලුත් යෝජනා ඇත්නම් ඒවාද ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, මහයායවත්ත පුස්තකාලයට සම්බන්ධව කේක් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යොදා ඇති නමුත් එවැනි වැඩසටහන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා සිදු කරන බැවින් මහයායවත්ත වැනි ප්‍රදේශයකට දරුවන්ගේ අධ්‍යාපනික ගුණවගාව සංවර්ධනය කිරීමට හොඳ දේශකයෙකු සම්බන්ධ කරමින් දරුවන්ගේ මනස වර්ධනය කර යමක් කිරීමට හැකිනම් එය වඩාත් ඵලදිායි වන බව පවසන ලදි. එම ප්‍රදේශවල දරුවන් විශාල වශයෙන් අගතිය කරා පත්වන බව පෙනී යන අතර පුස්තකාලය වටා වැඩි වශයෙන් දරුවන් රොක්වන බැවින් අර්ථවත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමෙන් දරුවන්ව අගතිය කරා යාම වලක්වාගත හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රි එස්.ඒ.දීපාල් මහතා කතා කරමින්, මහයායවත්තේ කේක් වැඩසටහනක් සඳහා රු.7000ක් වෙන් කර ඇති අතර එම ප්‍රදේශයේම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් සඳහා වෙන් කර ඇත්තේ රු.3000ක් බව පවසන ලදි. එම මුදල ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගැනීමටවත් ප්‍රමාණවත් නොවන බව පවසන ලදි. ඒ අනුව රු.7000ක මුදල මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනට යොමු කිරීම සුදුසු බව පවසන ලදි.

ගරු මන්ත්‍රි එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ ගාලවත්ත, බොරලැස්ස ප්‍රදේශවල ප්‍රජා ශාලා කිහිපයක්ම ඇති බැවින් එම ප්‍රජාශාලාවන් ප්‍රයෝජනයට ගිනිමින් නව පුස්තකාලයක් ස්ථාපිත කර දිය හැකි නම් ඵලදායි වන බවයි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ එතුමියගේ පෞද්ගලික අදහසට අනුව දරුවන්ට පෙර පොලීසියේ නිලධාරින්ට දැනුවත් කිරීමේ වැඩසටහනක් තිබීම සුදුසු බව පවසන ලදි. එයට හේතුව මත්ද්‍රව්‍ය වැලැක්වීමට වර්තමානය වන විට විශාල වශයෙන් පොලීසිය හරස් වී ඇති බව පවසන ලදි. එම නිසා දරුවන්ගේ අධ්‍යාත්මික ගුණ වගාව පෝෂණය කිරීම සඳහා හොඳ දේශකයෙක් ගෙන්වා වැඩසටහනක් සංවිධානය කිරීම සුදුසු බව නැවතත් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව මහයායවත්ත පුස්තකාලය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ කේක් වැඩසටහන වෙනුවට දරුවන්ගේ අධ්‍යාත්මික ගුණ වගාව සංවර්ධනය කිරීමට හොඳ දේශකයෙක් ගෙන්වා අර්ථවත් වැඩසටහනක් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි එස්.ඒ.දීපාල් මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් මෙම යෝජනාව ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාවට යොමු කිරීමට තීරණය කරන ලදි.

16) වෛද්‍ය ආධාර ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අ.අං | රෝගියාගේ නම | ලිපිනය | රෝගය | මුදල |
|---|---|---|---|---|
| 1 | ඩබ්.ගරුට් රූට් | නො.340/A, සණස මාවත, | පියයුරු පිළිකා, ඇඳුම | 25000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | රේණුකා | සින්දාත්‍රිය, වයික්කාල | රෝගය, තයිරොයිඩ්, ආතරයිටිස් | |
| 2 | පී.පී.ප්‍රැන්සිස් ස්ටීවන් | නො.340/A, සංඝස මාවත, සින්දාත්‍රිය, වයික්කාල | හෘදයාබාධ | 25000.00 |

17) වැසිකිලි ආධාර ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යේජනාව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

i. එම්.ආර්. හෂිනි මල්ෂා - නො.244/2, මහයායවත්ත,කහටවිල,පොතුවටවන - රු.25,000.00
ii. කේ.ඒ.අශෝකා කාන්ති - ඇටඹගහවත්ත, සෙන්දිරියාමුල්ල - රු.100,000.00

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් වැසිකිලි ආධාර ලබා දීමේදි ග්‍රාම සේවා නිලධාරියාගේ වාර්තාව ලබා ගත යුතු අතර එම වාර්තාව මහ සභාවටද ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

18) කමිටු රැස්වීම වලට සහභාගි නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අනු අංකය | මන්ත්‍රීවරයාගේ නම | කාරක සභාව/මහ සභාව | දිනය |
|---|---|---|---|
| 1 | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.09.15 |
| 2 | ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.09.15 |
| 3 | ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.09.17 |
| 4 | ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.09.17 |
| 5 | ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.09.17 |
| 6 | ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.09.17 |
| 7 | ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.09.18 |
| 8 | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා | කාර්මික සේවා කාරක සභාව | 2025.09.16 |
| 9 | ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා | කාර්මික සේවා කාරක සභාව | 2025.09.16 |
| 10 | ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීඩ් මිය | මහ සභාව | 2025.10.14 |

| | | | |
|---|---|---|---|
| 11 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා | මහ සභාව | 2025.10.14 |

19) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට අයත් වෙන්/බස්නැවතුම්පොළ පළමු අදියර පළමු මහල 03 කඩ කාමරය පී.ඩී.එස්. සාවින්ද අප්පුහාමි 2019.02.07 දින බදු ලබා ගෙන ඇත. එහි බදු අයිතිය ආර්.එම්.සුජීව රන්දෙනිය වෙත අදාල පැවරුම් ගාස්තු අය කර වසර 03කට බදු ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යේජනාව ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

20) ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ අනතුරුදායක එළිමහන් ප්‍රේක්ෂකාගාරය ඉවත් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, පෙර පැවති මහ සභාවකදි ගොඩනැගිලි පර්යේෂණ වාර්තාව ලබා ගැනීමට මුදල් ගෙවීම අනුමත කල අතර එම මුදල මේ වන විට ගෙවා ඇති බැවින් අදාල වාර්තාව මේ වන විට ලැබී ඇති බවත් එම වාර්තාවේ සඳහන් ආකාරයට ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රඩාංගනයේ එළිමහන් ප්‍රේක්ෂකාගාරය අනතුරුදායක බවත් එය භාවිතයට නුසුදුසු බවත් පැහැදිලිව දන්වා ඇති බව පවසන ලදි. මෙවැනි තත්වයකදි දරුවන්ව අවධානමකට ලක් කල නොහැකි අතර එය ප්‍රාදේශිය සභාවටද අවධානමක් විය හැකි බව පවසන ලදි. ඒ අනුව නොවැම්බර්, දෙසැම්බර් කාල වකවානු තුල මෙය ප්‍රතිසංස්කරණය කල යුතු අතර ඒ පිළිබඳව මේ වන විටත් සාකච්ඡා කරමින් පවතින බව පවසන ලදි. ඒ අනුව එළිමහන් ප්‍රේක්ෂකාගාරය ඉවත්කොට ඊළඟ වර්ෂයේ නව සැලැස්මට අනුව එළිමහන් ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

මේ පිළිබඳ පැහැදිලි කිරීම සඳහා වැඩ අධිකාරි මහතාට අවස්ථාවක් ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු වැඩ අධිකාරි මහතා විසින් පැහැදිලි කිරීමක් කරන ලදි. ඉන්පසු නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ ගස් කැපීම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කර එම විමර්ෂණ වාර්තාව මීළග මහ සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

21) මැ/නයිනමඩම ග්‍රාම නිලධාරි වසමට අයත් ඩිස්පැන්සරිය පාරෙන් ආරම්භ වී මනුර නිව්ටන් පාර වම්පස 03 පාරෙන් අවසන් වන, ඩිස්පෙන්සරිය පාර වම් පස 02 පාර සහ ගලයාය ජනපද පාර වම් පස 04 වන පාර නමින් ගැසට් වී ඇති මාර්ගය කලාශිල්ප ශ්‍රීමති රසාදරි මාවත ලෙස නම් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මහතා කතා කරමින්, පුද්ගලික නාම වලින් පොදු ස්ථාන එනම් මාර්ග, ක්‍රීඩාංගන හා ප්‍රජා ශාලා වැනි දේවල් නම් කිරීමට විරුද්ධ වන බව පවසන ලදි. එවැනි ස්ථානවලට පූජ්‍ය පක්ෂයේ හෝ රටට විශාල මෙහෙවරක් ඉටු කල රණවිරුවෙකුගේ හෝ නමක් යෙදීම ගැටලුවක් නොවන අතර පෞද්ගලික කැමැත්ත මත එක් එක් අයගේ පෞද්ගලික අවශ්‍යතාවය මත මාර්ග හෝ පොදු ස්ථාන නම් කිරීම නුසුදුසු බව පවසන ලදි. එකල විශාල වටිනාකමක් ඇති ඉඩමක් මිලදී ගැනීමට ගිය මොහොතේදි එකල සිටි පාලකයින්ගේ වචනයට ගරු කරමින් එම ඉඩම ප්‍රාදේශිය සභාවට පවරා ගැනීමට ඉඩ දුන් අතර වර්තමානය වන විට එම ඉඩම ක්‍රීඩාංගනයක් බවට පත් වී ඇති අතර එම ක්‍රීඩාංගනයටද පෞද්ගලික නමක් ලබා දී ඇති බව පවසන ලදි. එය එකල පැවති පාලනයේ සිදු වූ අඩුපාඩුවක් වූ අතර එකල තීරණ ගැනීමට විපක්ෂයට අවස්ථාවක් නොලැබුණු නමුත් වර්තමාන මන්ත්‍රිවරුන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනාගේ අදහස් වලට සවන් දෙන බව පවසන ලදි. ඒ අනුව ඉදිරියේදි පෞද්ගලික නම් වලට පොදු දේපල නම් කිරීමට ඉඩ නොදෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රමාලතා මිය කතා කරමින්, පාරක් නම් කිරීමේදි රට ජාතිය වෙනුවෙන් මෙහෙවරක් ඉටු කල සහ එම ප්‍රදේශය තුල යම්කිසි නමක් ගොඩනගාගත් පුද්ගලයෙක් වේ නම් එම මාර්ගය, ක්‍රීඩාංගනය හෝ ප්‍රජා ශාලාවක් වැනි දෙයක් එම පුද්ගලයා අනුස්මරණය කිරීම වෙනුවෙන් නම් කිරීම පිළිබඳව විරුද්ධත්වයක් නොමැති බව පවසන ලදි. නමුත් වෙන්නප්පුව ආසනය තුල තිබෙන බදු මුදල් වලින් මිලදී ගන්නා වූ දේපල සීමිත වසරකට දේශපානය හොබවන පිරිස් වෙනුවෙන් නම් කිරීම නැවැරදි නොවන බව පවසන ලදි. ඒ අනුව ඉහත යෝජනාව පරිදි එම මාර්ගයට නම් කිරීමට යොදා ඇති එම නාමය හිමි මහත්මිය කලාව වෙනුවෙන් විශාල මෙහෙවරක් සිදු කල කලා ශිල්පිනියක් බව පවසන ලදි. ඒ අනුව එම මාර්ගය කලාශිල්ප ශ්‍රීමති රසාදරි මාවත ලෙස නම් කිරීම ගැටලුවක් නොවන බව පවසන ලදි.

22) අප සභාවට අයත් ටිපර් රථය 2025.10.12 දින පෙ.ව 3.00 වන විට තබ්බෝව බලා පිටත් වි ඇති බව දන්වමින් ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳ සාකච්ඡා කිරීම.

ගරු සභාපතිතුමා කතා කරමින්, Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ තබ්බෝව ප්‍රදේශයේ මෙහෙයුමට සියලුම පළාත් පාලන අයතනයන්ගේ ඇති ට්‍රැක්ටර් රථ සහ ටිපර් රථ එම මෙහෙයුමට ලබා දෙන ලෙස ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා සහ දිසාපතිතුමා විසින් ලිපියෙන් ඉදිරිපත් කර තිබූ අතර එම ඉල්ලීමට අනුව එදින ටිපර් රථය යැවූ බව පවසන ලදි. ඒ අනුව ඉන්ධන වියදම ලබා දීමට පොරොන්දු වූ අතර එම වියදම් ඇස්තමේන්තුව එලැබෙන මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යොමු කරන බව පවසන ලදි. එමෙන්ම එම ස්ථානයේ සියලුම පළාත් පාලන ආයතනවල ටිපර් රථ රියදුරන් සිටි අතර ඔවුන්ද එම ලබා ගත් අත්දැකීම පිළිබඳ හොඳ අදහස් ඉදිරිපත් කල බව පවසන ලදි. ඒ අනුව පැවති තත්වයට අවශ්‍ය පිළියම් යෙදුවා මිස කිසිදු අනීතික කටයුත්තක් සිදු නොකල බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා ප්‍රකාශ කර සිටියේ එම මොහොතේ යම්කිසි ආකාරයකින් අනතුරක් සිදු වූවා නම් එම වාහනය පැදව ගිය නිලධාරියා අපහසුතාවයට පත් වන බවයි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ එම තීරණය ලේකම්තුමා සමඟ සාකච්ඡා කර ගත් තීරණයක් බවත් යම්කිසි දෙයක් සිදු වූවා නම් කිසිදු විටෙකවත් නිලධාරියාව අපහසුතාවයට පත් නොකර ඒ සියලු වගකීම් තමා සතු කර ගන්නා බව පවසන ලදි. එමෙන්ම "පුටුවු නැතිව ගියත් එම අවධානම ගන්නා බව" ගරු සභාපතිතුමා විසින් පවසන ලදි. එමෙන්ම ප්‍රජාව වෙනුවෙන් ගත යුතු තීන්දු තීරණ එම මොහොතේ අනීතිකව නොව සියලුම නීති රෙගුලාසි වලට යටත්ව සිදු කල බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, ගරු සභාපතිතුමා හැර වෙනත් අයෙකුට මෙම පාලනය ගෙන ගිය නොහැකි බව ප්‍රකාශ කරන ලදි. එමෙන්ම 2025.10.12 දින ඇමතිතුමා විසින් යම්

ලිපියක් වට්ස්ඇප් හරහා යොමු කලේ නම් ක්ෂණිකවම සියලුම මන්ත්‍රීවරුන්ව දැනුවත් කිරීමට හැකියාව තිබූ නමුත් එසේ නොකිරීම වරදක් බව පවසන ලදි. ඒ අනුව ඉදිරියේදි එසේ නොකිරීමට කටයුතු කරන ලෙස ඉල්ලූ අතර රට දියුණු කිරීමට සිදු කරන මෙහෙයුම් සඳහා උපකාර කිරීමට එතුමාද කැමති බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ඞී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, ජපානයෙන් අපේ රටට කසල ඉවත් කිරීමේ වාහන ලබා දෙන බවට අන්තර්ජාලය ඔස්සේ පුවතක් දුටු අතර ඒවා විවිධ දිස්ත්‍රික්ක වලට ලැබී ඇති බැවින් අපටද එවැන්නක් ලැබෙනවාද යන්න විමසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් වයඹ පළාත් අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඊළඟ වසරට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලැයිස්තුවක් ඉල්ලා ඇති අතර එම ලැයිස්තුව මේ වන විට ලබා දී ඇති බව පවසන ලදි. ඒ අනුව ඉල්ලා ඇති වාහන සියල්ලම නොලැබුනද යම් ප්‍රමාණයක් හෝ ලබා ගත හැකි බව පවසන ලදි. එම අවශ්‍යතාවය අනුව දංකොටුව නගරයට කම්පැක්ටර් රථයක් ඉල්ලා ඇති අතර බොහෝ විට මීළඟ වසරේ මාර්තු මස වන විට එම රථය ලැබීමට ඉඩ ඇති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා කතා කරමින්, ටිපර් රථය තබ්බෝව ප්‍රදේශයට යැවීම පිළිබඳව අදහස් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව වෙන්නප්පුව ආසනයේ සම්පත් වෙන්නප්පු ආසනයෙන් පිටත යා නොහැකි අතර පුත්තලමට යැවීමට තරම් ප්‍රාදේශීය සභාව සතුව ප්‍රතිපාදන නොමැති බව පවසන ලදි. මීට පෙර පැවති පාලන කාලයන් තුල එකල සභාපතිතුමන්ලා සමඟ සාකච්ඡා කර යම් කරුණු මහ සභා වාර්තාවෙන් ඉවත් කර ගැනීමට පවා සුහදව සාකච්ඡා කල නමුත් වර්තමානයේදි එම තත්වය ගිලිහි ඇති අතර ගරු සභාපතිතුමා ලබා දෙන පිළිතුරු වලට සමාන පිළිතුරුම ලබා දීමට සිදු වී ඇති බව පවසන ලදි. එමෙන්ම නීති රීති පිළිබඳ කතා කල නමුත් නීතියට පටහැනිව ක්‍රියා කරන්නේ නම් එය නිවැරදි නොවන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා කතා කරමින්, එම අවස්ථාවේ එම ටිපර් රථය භාවිතා කලේ පොදු අරමුණක් වෙනුවෙන් වූ අතර එම අවශ්‍යතාවය ක්ෂණිකව මතු වූ අතර එම අරමුණ පොදු අරමුණක් වූ බැවින් එහි වරදක් නොමැති බව පවසන ලදි. එමෙන්ම එම මෙහෙයුම එක් ආසනයක් නොව සමස්ත ජනතාව වෙනුවෙන්ම සිදු කල ක්‍රියාවක් බවත් පවසන ලදි. එසේ නම් ආසනය සතු සම්පත් පමණක් භාවිතා කල යුතු නම් මධ්‍යම ආණ්ඩුවෙන් ලබා දෙන කිසිදු දෙයක්ද ලබා ගත නොහැකි බව පවසන ලදි. එහෙත් එම ක්‍රියාදාමය ගරු සභාපතිතුමා සිදු කලේ පෞද්ගලික අරමුණක් වෙනුවෙන් නොව සමස්ත ජනතාවගේ පොදු අරමුණ වෙනුවෙන් බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, ගරු සභාපතිතුමාගේ අදහස මානුෂික වූවත් නෛතික රාමුවෙන් පිටත යා නොහැකි බව පවසන ලදි. කුමන හෝ ගැටලුවක් සිදු වූවා නම් එයට සියලු දෙනාටම වගකීමට සිදු වන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා කතා කරමින්, විමර්ෂණ නිලධාරින් විසින් සිදු කල පුහුණු වැඩසටහනෙහි වනාතවිල්ලුවට අප ප්‍රාදේශීය සභාවේ වාහන යවා වැඩකටයුතු සිදු කර ඇති බව පැවසූ අතර එම පාලන කාලය තුල නීති රීති ගැටලු නොතිබුනේද යන්න සභාවෙන් විමසන ලදි. එමෙන්ම ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා පෙර පැවති මහ සභා වාරයකදි මැටිකොටුව නෙළුම් උයන ප්‍රජා ශාලාවෙහි අගුලු කඩා අනවසරයෙන් ඇතුළු වී අනීතික කටයුත්තක් සිදු කල බව මහ සභාවේදිම පැවසූ බවත් එම ක්‍රියාදාමයන් වල ප්‍රතිවිපාක වර්තමානයේදි අත්විදිමින් පවතින බවත් පවසන ලදි. එමෙන්ම හදිසි ගින්නක් ඇති වූ විටෙක වෙනත් ස්ථානයක ඇති ගිනි නිවන රථයක් ගෙන්වා ගැනීමට ලිපි ලේඛන සකස් කර සිටිනවාද නැතහොත් ක්ෂණිකව ක්‍රියාත්මක වනවාද යන්න මහ සභාවෙන්

විමසන ලදි. එමෙන්ම භෞතිකව ඇති වන ගැටලු වලට මුහුණ දීමේදි මෙවැනි දෑ ප්‍රායෝගිකව විසදා ගත යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, දිසාපතිතුමා සහ ගරු පරිසර නියොජ්‍ය ඇමතිතුමා ලිපි එවා ටිපර් රථ ඉල්ලුම් කල අවස්ථාවේ මන්ත්‍රීමණ්ඩලය දැනුවත් නොකිරීම පිළිබඳව කණගාටුව පල කරන ලදි. එකල එතුමාගේ පාලන කාලය තුල වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාව වෙත වාහන ලබා දුන්නේ සියලුම අවසර ලබා දුන් ලිපි ලේඛන ඇතිව බව පවසන ලදි. එසේ නොකලේ නම් එක මොහොතක්වත් සභාවේ රැදී සිටීමට නොහැකි වන බව පවසන ලදි.

5. **කාරක සභා වාර්තා සලකා බැලීම.**

**a. 2025.09.15 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

- 2025.09.15 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

**b. 2025.09.16 දින පැවති කාර්මික සේවා කාරක සභාව**

- 2025.09.16 දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

**c. 2025.09.18 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව**

- ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, කහටවිල කොට්ඨාසයේ පසුගිය දිනයක කහටවිල කොට්ඨාස භාර මන්ත්‍රීතුමා විසින් ගමේ ජනතාවට වැවේ මත්ස්‍යයින් ඇල්ලීම තහනම් කර ඇති බව පවසන ලදි. ඒ අනුව මත්ස්‍යයින්ගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය ඇත්තේ එක් පක්ෂයක ජනතාවට පමණක්ද බව විමසන ලදි. මීට පෙර කහටවිල කොට්ඨාසයේ මන්ත්‍රීවරිය ලෙස වසර 05ක කාලයක් සේවය කල අතර කිසිදු දවසක පක්ෂ භේදයකින් තොරව කටයුතු කල බව පවසන ලදි. මීට පෙර කිසිදු දිනයක වැවේ මත්ස්‍යයින් ඇල්ලීම පිළිබඳ කිසිදු අයෙකු සමඟ ගැටලුවක් ඇති කර නොගත් බව පවසන ලදි. එම වැවේ ව්‍යාප්ත වී ඇති මාළු එතුමියගේ පාලන කාලය තුල වැවට දමා ඇති අතර එම මත්ස්‍යයින්ව ඇල්ලීමට කිසිවෙකුවත් වැලැක්වීම නිවැරදි නොවන බව පවසන ලදි. ඒ අනුව කොට්ඨාසය තුල ජීවත් වන සියලු දෙනාටම කොට්ඨාසයේ ඇති ස්වාභාවික සම්පත් පල නෙලා ගැනීමේ හැකියාව සියලු දෙනාටම ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

  ගරු සභාපතිතුමා කතා කරමින්, ධීවර සමිති යනාදිය ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් පාලනය වන අතර එම කරුණු පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාවට අයත් නොවන බව පවසන ලදි. ඒ අනුව ඉහත ගැටලුව ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස පවසන ලදි.

  ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මහතා කතා කරමින්, ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය ඉදිරිපත් කල කරුණ වැරදි බව ප්‍රකාශ කරන ලදි. පුද්ගයින් කිහිපදෙනෙකුගේ ගැටලුවක් විසඳු අතර වෙනත් කිසිදු ගැටලුවක් නොපවතින අතර ඕනෑම අයෙකුට මත්ස්‍යයින් ඇල්ලීමට ඉඩ ඇති බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය ලුණුවිල ප්‍රදේශයේ කුණු ගොඩවල් ඇති බැවින් ඉදිරියට පැමිණෙන වැසි කාලය තුල ඩෙංගු ඉහල යාමක් ඇති විය හැකි බැවින් ඒ පිළිබඳ සොයා බලා කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා පවසා සිටියේ එම මාර්ග අවුරුදු ගණනාවක් කිසිදු පාලන කාලයක ප්‍රතිසංස්කරණයක් සිදු නොවූ අතර මාර්ගය දෙපස කුණු රොඩු දමා තිබු බව පවසන ලදි. ඉන්පසු ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා සහ ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මහතා එකතු වී මෝටර්ග්‍රේඩරය යොදාගෙන මාර්ගය පිරිසිදු කල බව පවසන ලදි. එම පිරිසිදු කිරීම් කරන අතරතුර ටිපර් රථය ගෙන්වා ගැනීමට නොහැකි වූ බැවින් එම වැඩකටයුතු නැවැත්වීමට සිදු වූ බවත් හැකි ඉක්මනින් ඉතිරි කුණු රොඩු යනාදිය ඉවත් කර දෙන බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය පවසා සිටියේ එම පවිත්‍ර කිරීම් සිදු කිරීමේදි පස් කඳු ගොඩ ගැසීම නිසා ජනතාව කුණු දමා යාමට පෙළඹී ඇති බවයි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, දූම්මලදෙනිය මාර්ගය දෙපස පවිත්‍ර කිරීම සම්බන්ධව ලිපි ඉදිරිපත් කල අතර මේ වන විට එම පවිත්‍ර කිරීම් සිදු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා වෙත ස්තූතිය පුද කරන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, අත් පත්‍රිකාවක් සකස් කර ඇති අතර හැකි ඉක්මනින් එය ජනතාවට බෙදා දිය යුතු බව පවසන ලදි. එමෙන්ම කසල කළමනාකරණය මේ වන විට සමස්ථ ගැටලුවක් වී ඇති අතර එය කලමනාකරණය කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව පවසන ලදි. එමෙන්ම ඒ සම්බන්ධයෙන් ඇති යෝජනා හා අදහස් ඉදිරිපත් කරන ලෙස පවසන ලදි. එමෙන්ම වර්තමානය වන විට කොන්ක්‍රීට් කැබලි ජල පෝෂක ප්‍රදේශ වලට දමා යන අතර මෙම ගැටලු වලටද ඉක්මන් පිලිතුරක් සෙවිය යුතු බව පවසන ලදි.

**d. 2025.09.17 දින පැවති ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව**

- ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, 2014 වසරේ ලබා දුන් පෙර පාසල් ගුරුවරියන්ගේ පත්වීම පිලිබද ගැටලුවක් පැවති අතර එය නිවැරදි කිරීම සඳහා ලේකම්තුමා මැදිහත් වී එය අදාල කාර්යාල වලට යොමු කල අතර මේ වන විට එහි වර්තමාන තත්වය කුමක්ද යන්න විමසන ලදි.

  මේ පිලිබඳ පරිසර නියෝජ්‍ය ඇමතිතුමා සමඟ සාකච්ඡා කල අතර එම ගුරුතුමියන්ගේ රැකියා සුරක්ෂිතභාවය පිලිබඳ කිසිදු ගැටලුවක් නොමැති අතර ඉදිරි මාස කිහිපය තුල එම පත්වීම් ලබා ගත හැකි වන බව පවසන ලදි.

**e. 2025.09.24 දින පැවති පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව**

- බලතල පැවරීමට අනුව කිසිදු ක්‍රියාදාමයක් මෙම කාරක සභාව තුල සිදු වී නොමැති අතර නිම කරන වැඩ කොටස් පිලිබඳ වාර්තාවක් ලබා නොදෙන්නේ ඇයිදැයි විමසන ලදි. එමෙන්ම මන්ත්‍රීවරුන්ට වැටුපක් ලබා දුන් නමුත් ජනතාවට සේවය කිරීමට අවස්ථාවක් නොලැබේ නම් එම වැටුපෙන් පලක් නොමැති බව පවසන ලදි.

  ගරු සභාපතිතුමා කතා කරමින්, සෑම කමිටුවක්ම ප්‍රගති සමාලෝචනයක් සිදු කිරීමට සුදුසු බව පවසන ලදි. එවිට අතපසු වූ තීන්දු තීරණ සොයා බලා කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

මේ වන විට සීමිත සම්පත් ප්‍රමාණයක් ඇති බැවින් එකවර විශාල වැඩ කොටසක් කිරීමට නොහැකි බැවින් සම්පත් කලමනාකරණය කරමින් ආසනය තුල වැඩ කටයතු සිදු කරන මෙන් ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා කතා කරමින්, මිනි කනත්තය අසල සිදු වූ මිනී මැරුම පුවත්පත් වල පවා පල වූ අතර එම විදුලි පහන තවමත් සාදා නොමැත්තේ කිනම් කාරණාවක් නිසාද යන්න විමසන ලදි. එමෙන්ම විදුලිය ලබා දෙන ආයතනය විදුලිය ලබා දීමට විරුද්ධත්වයක් නොමැති නම් ප්‍රාදේශිය සභාව මැදිහත් වී මෙම විදුලි රැහැන් සාදා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, එම ස්ථානයට ගොස් ස්ථානීය පරික්ෂාවක් සිදු කල අතර වයර සියල්ලම ඇති අතර විදුලි සම්බන්ධතාවය ලබා දීමට පමණක් අවශ්‍ය බව පවසන ලදි. ඒ පිළිබඳ අවධානය යොමු කර ඇති අතර එම කටයුත්ත සිදු කිරීමට පියවර ගන්නා බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මහතා කතා කරමින්, එම ප්‍රදේශයේ ජනතාව මේ සම්බන්ධයෙන් කිසිදු දැනුවත් කිරීමක් සිදු කර නොමැති අතර පසුව සිදු කල සොයා බැලීමකදි මෙවැනි තත්වයක් ඇති බව නිරීක්ෂණය වූ බව පවසන ලදි. ඉන් පසු ගරු උපසභාපතිතුමා සමඟ සම්බන්ධ වී මෙයට ගත යුතු ක්‍රියාමාර්ගය සාකච්ඡා කල අතර මේ වන විට අවශ්‍ය කටුයුතු සිදු කරමින් පවතින බව පවසන ලදි. නමුත් ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා පවසන් ආකාරයේ ප්‍රශ්නයක් ජනතාවට නොතිබුනු අතර එතුමාගේ ජනප්‍රියතාවය වෙනුවෙන් මෙසේ පවසනවාද යන්න ගැටලුවක් ඇති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා පවසා සිටියේ එතුමන්ලා කොට්ඨාස මන්ත්‍රීවරු නොව වෙන්නප්පු ආසනයෙන් පත් වූ මන්ත්‍රීතුමන්ලා බව පවසන ලදි. එතුමා එක් කොට්ඨාසයක පමණක් නොව සෑම ග්‍රාමයක් පුරාම ගමන් කරන අයෙකු ලෙස තමාද අනෙකුත් ජනතාව මුහුණ දෙන ගැටලුවට මුහුණ දෙන බව පවසන ලදි. අදාල කොට්ඨාස භාර මන්ත්‍රීවරයාගේ යුතුකම හරියාකාරව ඉටු කලා නම් මෙවැනි ගැටලු උද්ගත නොවන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා පවසා සිටියේ විදුලිබල මණ්ඩලය විසින් අනවසරයෙන් ඇද ඇති විදුලි රැහැන් ඉවත් කරන අතර විදුලිය සැපයීමට අවශ්‍ය නම් ප්‍රාදේශිය සභාවෙන් මුදල් ගෙවා ඇලුමිනියම් කොටස පුළුල් කිරීමට ඇස්තමේන්තුවක් සාදා එය සකස් කිරීමට පියවර ගත යුතු බව පවසන ලදි. මුදල් ගෙවීමක් නොකර හිතුමතේ කණු සිටවා විදුලි රැහැන් දික් කිරීමට අවසර නොමැති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා කතා කරමින්, සභාව සතුව ඇත්තේ ෆ්ලෑෂර් ලයිට් 05ක් බැවින් කොට්ඨාස භාර මන්ත්‍රීවරුන්ද ජනතාවගේ අවමංගල්‍ය අවශ්‍යතාවලදී ගැටලු වලට මුහුණ දෙන බව පවසන ලදි. මෙහිදි පක්ෂ විපක්ෂ බෙදීමක් ඇති බව වාදයක් වට්ස්ඇප් සමූහය තුල ඇති වූ බවත් එවැනි බෙදීමක් කිසිදු විටෙක නොමැති බවත් පවසන ලදි. එමෙන්ම වීදි පහන් අලුත්වැඩියා කරන නිලධාරීන් වෘත්තීමය විදුලි කාර්මිකයින් නොවන බැවින් ඔවුන් අතින් යම් යම් අඩුපාඩු සිදු විය හැකි බව පවසන ලදි. එම නිසා ඉදිරියේදි වෙන්න්පුව ප්‍රාදේශිය සභාවට හොඳ විදුලි කාර්මිකයින්ගේ අවශ්‍යතාවය පවතින බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා කතා කරමින්, එකම ප්‍රදේශයේ අවමංගල්‍ය අවස්ථා දෙකක් සිදු වූ අතර එක් අවමංගල්‍යයක් එතුමාගේ හිතවතෙක් වූ අතර එම අවමංගල්‍ය සඳහා ෆ්ලෑෂරයක්

ලබා දීම සඳහා ප්‍රාදේශීය සභාව දැනුවත් කල නමුත් අවමංගල්‍ය සිදු වූ දිනයේ නොව පසු දින විදුලි ආලෝකය ලබා දුන් බව පවසන ලදි. එහෙත් පෙර දිනයේ සිදු වූ අවමංගල්‍ය සඳහා මිනිත්තු 30ක් වැනි කෙටි කාලයක් තුල ෆ්ලෑෂරයක් ලබා දී ඇති බව පවසන ලදි. එම මිය ගිය පුද්ගලයා ආණ්ඩු පක්ෂයට සම්බන්ධ හිතවතෙකු වූ බැවින් එය ක්ෂණිකව ක්‍රියාත්මක වූ බව පවසන ලදි. එමගින් විපක්ෂයේ මන්ත්‍රීවරුන් පත්වන අපහසුතාවය පිලිබඳ කණගාටුව පල කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටියේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලෙස එතුමාද මෙවැනි ගැටලු රාශියකට මුහුණ දී ඇති බවයි. සීමිත සම්පත් ප්‍රමාණයක් ඇති බැවින් කලමනාකරණය කරගනිමින් කටුයුතු සිදු කල යුතු අතර මෙම ප්‍රායෝගික ගැටලුව විවෘත මනසකින් තේරුම්ගත යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රීනී අයි.නයෝමි රම්‍යලතා මිය විසින් ප්‍රාදේශීය සභාවේ යන්ත්‍රෝපකරණ පිළිබඳ ගැටලුවක් පවතින බව පවසන ලදි. මහ සභාවේදී එක්ස්කැවේටර් යන්ත්‍රය පාසල්, දේවස්ථාව හා විහාරස්ථාන සඳහා ලබා නොදෙන බවට මහ සභා තීරණයක් ගෙන ඇති අතර එය මේ වන විටත් ක්‍රියාත්මකද යන්න විමසන ලදි. එහෙත් මේ වන විට එක්ස්කැවේටර් රථය ගම්වලට ලබා දීමට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කැමති නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් අකමැතිය යනුවෙන් ගම්වල ජනතාව අතර මතයක් ව්‍යාප්ත වී ඇති බව පවසන ලදි. ඒ අනුව එතුමිය පවසා සිටියේ මහ සභාව තුල යම් තීන්දු තීරණ ගෙන ඇත්නම් ඒවා විනිවිදභාවයක් ඇතිව පෙන්වා දිය යුතු බවයි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, වීදි පහන් අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට මන්ත්‍රීවරුන් සහභාගි නොවිය යුතුය යනුවෙන් තීරණයක් ගෙන ඇති නමුත් එසේ තීරණයක් ගත නොහැකි බව පවසන ලදි. ඒ පිළිබඳ විමර්ෂණ නිලධාරින්ගෙන් හා තවත් නිලධාරින්ගෙන් උපදෙස් ලබා ගත් බවද පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, මීට පෙර ඉදිරිපත් කල යෝජනා අදාල කාරක සභා වෙත ඉදිරිපත් කිරීම වෙනුවෙන් ස්තූතිය පුද කරන ලදි. එමෙන්ම එම යෝජනාව සම්බන්ධයෙන් හොඳ පිළිතුරක් බලාපොරොත්තු වන බව පවසන ලදි. කණු අංක කිරීම සිදු කිරීම තුලින් මෙම ගැටලුව විසඳා ගත හැකි බව පවසන ලදි. එමෙන්ම විදි පහන් අලුත්වැඩියා කල පසු නැවත එම කටයුත්ත සිදු ඇත්ද වන්න විමර්ෂණයක් කල යුතු බව පවසන ලදි. එය ප්‍රාදේශීය සභාව සතු වගකීමක් බව පවසන ලදි. එමඟින් පවතින අක්‍රමිකතා වලක්වා ගත හැකි බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, විදුල පහන් ගැටලුව සාකච්ඡා කර අවසන් කල හැකි දෙයක් නොවන අතර මේ වන විට පවතින විදුලි පහන් අබලන් තත්වයේ පවතින අතර ඉදිරි කාලය තුල නව වීදි පහන් කට්ටල මිලදී ගැනීමෙන් මෙම ගැටලුව බොහෝ දුරට මඟහරවා ගැනීමට කටයුතු කරන බව පවසන ලදි. එමෙන්ම ඉදිරියේදි පැමිණෙන ආපදා කලමනාකරණ කටයුතු සඳහා සූදානමින් සිටින බව පවසන ලදි.

ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය විසින් මාස 06-07ක් පමණ කාලයක් සිට සිරිගම්පල කොට්ඨාසයේ ජල ටැංකි වල ජලය නොතිබුනු අතර ඒ පිළිබඳ ප්‍රාදේශීය සභාව දිගින් දිගටම දැනුවත් කල අතර මේ වන විට එම අවශ්‍යතාවය ඉටු වී ඇති බව පවසන ලදි. ඒ වෙනුවෙන් කටයුතු කල ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මහතා සහ ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා වෙත ස්තූතිය පුද කරන ලදි.

f. 2025.09.03 හා 2025.09.09 දින පැවති ටෙන්ඩර් කමිටුව

- 2025.09.03 හා 2025.09.09 දින පැවති ටෙන්ඩර් කමිටුව සලකා බැලූ අතර ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවින් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා එකඟතාවය පල නොකරන බව පවසන ලදි.

## 6. ආදායම්/වියදම් වාර්තා හා වෙනත් වාර්තා සලකා බැලීම

a. 2025 අගෝස්තු මස ආදායම් වාර්තාව සලකා බැලූ අතර ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

b. 2025 අගෝස්තු මස වියදම් වාර්තාව සලකා බැලූ අතර ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

c. අගෝස්තු මස විදුලි පහන් නඩත්තුවට අදාල ප්‍රගති වාර්තාව සලකා බැලූ අතර ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

d. අගෝස්තු මස වාහන ධාවනයට අදාල වාර්තාව සලකා බැලූ අතර ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

## 7. වෙනත් කරුණු

<u>ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා</u>

1. හෝටල් ක්ෂේත්‍රයේ ගාස්තු නොගෙවීම පිළිබඳ සාකච්ඡා කිරීම.

- ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, හෝටල් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැරදි අර්ථකතනයන් ව්‍යාප්ත වන බැවින් මේ පිළිබඳව සාකච්ඡා කිරීමට තීරණය කල බව පවසන ලදි. හෝටල් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නඩු වලට පෙනී සිටි නීතිඥවරිය දේශපානයට අනුව තෝරා නොගත් අතර යහපත් දෙයක් සිදු කිරීමට ඇති කිසිදු මෙහොතක දේශපාලනික කොණයෙන් නොබලා නිවැරදි දෙයට අවස්ථාව සලසා දුන් බවත් පවසන ලදි. ලේකම්තුමා හරහා එම නීතිඥතුමියව සම්බන්ධ කර ගත් අතර ඇය තම පක්ෂයේ සාමාජිකයෙක් නොවූ බවද පවසන ලදි. නීතිඥවරයෙකුගේ පක්ෂය නොව එම පුද්ගලයාට නීතිය සම්බන්ධයෙන් ඇති දැනුම පිළිබඳ අවබෝධ කර ගැනීම වැදගත් බව පවසන ලදි. 2016 වසරේදි ආණ්ඩුකාරතුමන්ලා එකතු වී හෝටල් හිමියන් ගෙන්වා සාකච්ඡා කර මෙම ගැටලුව විසදීමට කටයුතු කල නමුත් 1%ක් ගෙවීමට හෝටල් හිමියන් එකඟ නොවී ඇති බව පවසන ලදි. ඉන්පසු නැවත 2018 වසරේදි ගරු සභාපති ධුරය ලබා ගත් පසු නැවත හෝටල් හිමියන් හා ආදායම් පරීක්ෂකවරු ගෙන්වා සාකච්ඡා කල අතර 2016 සිට නොලැබුනු සියලු බදු මුදල් 0.25%ක් ගෙවීමට හෝටල් හිමියන් එකඟ වූ බව පවසන ලදි. ඒ පිළිබඳ තනි තීරණයක් ගත නොහැකි නිසා මහ සභාවට යොමු කර තීරණක් ගත් අතර සියලු දෙනාගේම එකඟතාවය මත 0.25%ක් ගෙවීමට තීරණය කග බව පවසන ලදි. නමුත් මේ වන විට

ප්‍රාදේශිය සභාවේ මුදල් නැති බවට මතයක් ව්‍යාප්ත වී ඇති අතර හිටපු පාලකයින් එම මුදල් අවභාවිතා කර ඇති බවට වර්තමාන ආණ්ඩු පක්ෂය විසින් මතයක් ගොඩනගා ඇති අතර එවැනි ප්‍රකාශ සිදු නොකරන ලෙස ඉල්ලා සිටි අතර ජනතාවගේ බදු මුදල් කිසිදු දිනක නාස්ති නොකල බවද පවසන ලදි. සියලුම නිලධාරින් අවංකව සේවය කරමින් ප්‍රාදේශිය සභාවට මුදල් රැස් කර දුන් බවද පවසන ලදි. එමෙන්ම ප්‍රාදේශිය සභාව මෙම තත්වයට ගෙන ඒමට හිටපු ගරු සභාපතිවරුන් හා මන්ත්‍රිවරුන් සියලු විශාල කැපවීමක් කල බව පවසන ලදි. හෝටල් ක්ෂේත්‍රයෙන් අය විය යුතු ඉතිරි හිඟ මුදල් අය කල යුතු අතර එය වර්තමාන නායකයින් සතු වගකීමක් බව පෙන්වා දෙන ලදි. පසුගිය කාලයේදි මුහුණ දුන් කොවිඩ් වසංගත හා අරගල ගැටලු නිසා හෝටල්වලින් ලැබිය යුතු මුදල් සියල්ලම අය කිරීමට නොහැකි වුවත් අය කිරීමට පුලුවන් වූ මුදල් සියල්ලම ඉතිරි කර ධූර කාලය අවසන් කල බව එතුමා පවසන ලදි.

2. ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ වර්තමාන තත්වය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීම.

- ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ ක්‍රීඩාංගන භාරකරුගේ අභ්‍යන්තර ස්ථාන මාරුව පිළිබඳ ගැටලුවක් නොපවතින නමුත් මේ වන විට වැරදි අර්ථකථනයක් සමජගත වී ඇති බව පවසන ලදි. 2011 වසරේදි පැමිණෙන විට ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ ආදායම ලක්ෂ 1 ½ ක් පමණ වූවත් 2023 වසරේ ධූර කාලය අවසන් කර නික්ම යන මොහොතේ ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ ආදායම ලක්ෂ 80 පමණ ඉක්ම ගොස් තිබූ බවද පවසන ලදි. මෙම සියලු කටයුතු සිදු කිරීමට වෙහෙස වූහේ එවකට සිටි ක්‍රීඩාංගන භාරකරු ප්‍රවීණ ක්‍රීඩක තරංග කොස්තා බව පවසන ලදි. එවැනි පුද්ගලයෙකු නොසිතු අයුරින් ස්ථානමාරු කිරීම අනුමත කල නොහැකි බව පවසන ලදි. එමෙන්ම අභ්‍යන්තර ස්ථානමාරු ඕනෑම අවස්ථවක සිදු කල හැකි නමුත් කමිටු තීරණයක් ගත් පමණින් එසේ සිදු කරන්නේ කෙසේද යන්න විමසන ලදි. මේ වන විට ආදායම් පරීක්ෂක මහතෙකු ක්‍රීඩාංගන භාරකරු ලෙස මාරුකර ඇති අතර එහි ගැලපීමක් නොමැති බව පවසන ලදි. ඒ අනුව හිටපු ක්‍රීඩාංගන භාරකරු තරංග කොස්තා මහතාව ස්ථාන මාරු සිදු කලේ කුමන පදනමක් මතද යන්න විමසන ලදි.

3. කොඩි කණු සම්බන්ධ ගැටලුව සාකච්ඡා කිරීම.

- ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, කොඩි කණු ගැටලුව තරංග කොස්තා මහතාගේ වරදක් බව පැවසු නමුත් ඔහු එම ගැටලුවට සම්බන්ධ නොමැති බව පවසන ලදි. එමෙන්ම මේ වන විට කොඩි කණු සියල්ලම ඇති බවද පවසන ලදි. අරුන්දික ප්‍රනාන්දු ඇමතිතුමා ලබා ගත් කොඩි කණු දුම්මලකොටුව දේවස්ථානයේ ඇති අතර ජාතික ජන බලවේගයේ මන්ත්‍රිවරයෙකු විසින් එම කොඩි කණු නැවත ලබා දීම අවශ්‍ය නොවන බව දේවස්ථාව භාර පියතුමාට පවසා ඇති බව පවසන ලදි. එමෙන්ම ජගත් මන්ත්‍රිතුමා විසින් ලබා ගත් කොඩි කණුද තිබෙන අතර ඒවා ලබා ගත නොහැකි නම් එම මන්ත්‍රිවරුන්ගෙන් අදාල මුදල් අය කර මෙම ගැටලුව විසඳා ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

4. ලිහිරියාගම ජල ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම.

- 2020 වසරේදි සනත් නිශාන්ත ඇමතුතිමා විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කල අතර මෙමගින් ලිහිරියාගම කොට්ඨාසයම ආවරණය වන බවද පවසන ලදි. ඉන්පසු එය තරමක් අඩාල වී නැවත 2024 වර්ෂයේදි ආරම්භ කල බව පවසන ලදි. එතුමාගේ පාලන කාලයේදි ප්‍රාදේශිය සභාවෙන් මුදල් වෙන් කර ගනිමින් ජල ව්‍යපෘති ගණනාවක් තුලාවල, ඇටියාවල හා කිරිමැටියාන ප්‍රදේශවල සිදු කල බව පවසන ලදි. ඒ අනුව ලිහිරියාගම ජල ව්‍යාපෘතියෙහි වර්තමාන තත්වය පිළිබද විමසන ලදි. මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට සියලු මන්ත්‍රිවරු එකට එක්ට කටයුතු කිරීම වැදගත් බව පවසන ලදි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා</u>

5. ශිෂ්‍යාධාර ලබා දීම පිළිබඳ සාකච්ඡා කිරීම.

- ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා කතා කරමින්, පියාගේ රැකවරණය අහිමි වූ ශිෂ්‍යත්වය සමත් දරුවන්ට මාසික දීමනාවක් ලබා දිය හැකිද යන්න විමසන ලදි. පියා අහිමි පවුල් වල මව්වරුන් කුලී රැකියා වල නිරතවන අතර දරුවන්ට ඉගැන්වීම සඳහා මහත් පරිශ්‍රමයක් දරන බව පවසන ලදි. එම නිසා එම දරුවන්ට හොඳ පාසලකට යාමට අවස්ථාවක් ලැබුනත් පවතින ආර්ථික අපහසුතා මැද පාසල් යාමට නොහැකි තත්වයක් පවතින බැවින් මේ පිළිබඳ සොයා බලා එම පවුල් වල දරුවන්ට මාසික දීමනාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

  මේ පිළිබඳ ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාවේදි දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

ඉන් පසු සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00ට පමණ මහ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

ටී.බී.ඩී ඇන්ටනි කුමාර්
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.